# බුද්ධ ධර්මය

## 10 - ශ්‍රේණිය



The National e-learning Portal for The General Education

Start Your Learning Journey with e-thaksalawa

Copyright © www.e-thaksalawa.moe.gov.lk

# නිපුණතාව 07

ජීවි, අජීවි පරිසරයට හිතකාමී ව හැසිරෙයි.

# නිපුණතා මට්ටම 10.7.1

බුදුරජාණන් වහන්සේ ජීවි, අජීවි පරිසරය කෙරෙහි හිතකාමී ව ගත කළ අයුරු දැන පරිසර සංවේදී ජීවිතයක් ගත කිරීමට ක්‍රියා කරයි.

## පාඩම

16 බුදු සිරිතයි - පරිසරයයි

අන්තර්ගතය සැකසීම :- අධ්‍යාපන අමාත්‍යාංශය - ආගමික හා සාරධර්ම ශාඛාව

පරිගණක පිටු සැකසීම :- උදාර ජයවික්‍රම, හ/තෙළඹුයාය ක.වි. , හකුරුවෙල.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

# බුද්ධ ධර්මය

1. බුදු දහමේ සඳහන් වන ආකාරයට පරිසරයේ ස්වභාවය මත දෙයාකාරයට බෙදා දක්වයි. ඒවා නම් කරන්න.

2. **"මේ භූමි භාගය ඉතා රමණීයයි. වන ලැහැබ ඉතා ම ප්‍රසාදජනකයි. මනා තොට ඇති සුදු වැලිතලා මැදින් ගලන නදිය ද සිත් සනසවනසුලු වෙයි. හාත්පස සොඳුරු ගම ද වෙයි. පධන් වීර්යය වඩන කුල පුත්‍රයකුහට ඒ සඳහා මෙයට වඩා සුදුසු තවත් තැනක් නැතැයි මට සිත් විය."** මෙම ප්‍රකාශය සඳහන් සූත්‍ර දේශනාවේ නම ලියන්න.

3. බුදුරජාණන් වහන්සේ පරිසරයට මිතුරු ව කටයුතු කළා සේ ම පරිසරය ද උන් වහන්සේට මිතුරු ව කටයුතු කළ අවස්ථාවක් සත්සතිය අනුසාරයෙන් නම් කරන්න

4. බුදුරජාණන් වහන්සේ **පස්වන හා අටවන වස්කාල** ගතකළ ස්ථාන හැඳින් වූ නම ලියන්න.

5. බුදුරජාණන් වහන්සේට භද්දවග්ගිය කුමාරවරුන් හමු වූ ස්ථානයේ නම ලියන්න.

6. බුදු සිරිතේ සඳහන් පහත සඳහන් අවස්ථා හා සම්බන්ධ ස්ථාන හැඳින් වූ නම ලියන්න

    1. සිදුහත් කුමරු උපන් ස්ථානය ..........................................................................
    2. සිදුහත් බෝසතාණෝ බුදු වූ ස්ථානය ......................................................................
    3. බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑ ස්ථානය ........................................................

7. සුදත්ත හෙවත් අනේපිඩු සිටුතුමා මුලින් ම බුදුරජාණන් වහන්සේ මුණ ගැසුණු ස්ථානයේ නම ලියන්න.

8. බුදුරජාණන් වහන්සේ වේදනා පරිග්‍රහ සූත්‍රය හා අම්බට්ඨ සූත්‍රය දේශනා කළ ස්ථාන නම් කරන්න.

9. බුදුරජාණන් වහන්සේ රජගහනුවර හා ඒ අවට පිහිටි පරිසරයේ සුන්දරත්වය අගය කළ ආකාරය කෙටියෙන් දක්වන්න.

10. බුදුරජාණන් වහන්සේ නිශ්ශබ්දතාව අගය කළ ශාස්තෘවරයෙකි. උදාහරණ මගින් පැහැදිලි කරන්න.

අන්තර්ගතය සැකසීම :- අධ්‍යාපන අමාත්‍යාංශය - ආගමික හා සාරධර්ම ශාඛාව

පරිගණක පිටු සැකසීම :- උදාර ජයවික්‍රම, හ/තෙළඹුයාය ක.වි. , හකුරුවෙල.

Copyright © www.e-thaksalawa.moe.gov.lk